# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2190/7 – 2020 අගෝස්තු 24 වැනි සඳුදා – 2020.08.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2020 අංක 105 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/6/2019/HW/29.
ප්‍රා. ලේකම්ගේ යොමු අංකය: MLB/LND/LNDAQ/166.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 22 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැඳුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

01. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි:** ප්‍රාදේශීය ලේකම්, මාලිම්බඩ.

02. **ඉඩමේ විස්තරය:** දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළේ දකුණ සුළු කොට්ඨාසයේ, සුල්තානගොඩ නැගෙනහිර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ජ්/එම්එල්එම්/2019/349 හා 2019.07.10 දිනැති ප්‍රගමණ අනුරේඛණයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර "A" – ඉඩමේ නම - මඩිද්දුව හෙවත් මඩිද්දුවවිල – ප්‍රමාණය: හෙක්. 0.0459**

උතුරට: ඒ. එල්. අබේසිංහ හිමිකම් කියන මඩිද්දුවවිල; නැගෙනහිරට: ඒ. එල්. අබේසිංහ හිමිකම් කියන මඩිද්දුවවිල; දකුණට: චමින්ද වීරසේකර සහ තවත් අය හිමිකම් කියන මඩිද්දුවවිල සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර බී; බටහිරට: ඒ. එල්. අබේසිංහ හිමිකම් කියන මඩිද්දුවවිල.

02. **කැබලි අක්ෂර "B" – ඉඩමේ නම - මඩිද්දුව හෙවත් මඩිද්දුවවිල – ප්‍රමාණය: හෙක්. 0.0338**

උතුරට: ඒ. එල්. අබේසිංහ හිමිකම් කියන මඩිද්දුවවිල සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: චමින්ද වීරසේකර සහ තවත් අය හිමිකම් කියන මඩිද්දුවවිල; දකුණට: සුනිල් හේමන්ත සිල්වා හිමිකම් කියන මඩිද්දුවවිල සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර සී; බටහිරට: චමින්ද වීරසේකර සහ තවත් අය හිමිකම් කියන මඩිද්දුවවිල.

03. **කැබලි අක්ෂර "C" – ඉඩමේ නම - මඩිද්දුව හෙවත් මඩිද්දුවවිල – ප්‍රමාණය: හෙක්. 0.0254**

උතුරට: චමින්ද වීරසේකර සහ තවත් අය හිමිකම් කියන මඩිද්දුවවිල සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර බී; නැගෙනහිරට, දකුණට සහ බටහිරට: සුනිල් හේමන්ත සිල්වා හිමිකම් කියන මඩිද්දුවවිල.

09 - 172